Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2023 අප්‍රේල් 07, කොළඹ

## නෙස්ටොමෝල්ට් SALARY for LIFE 2022 අවසන් වෙයි

***තවදුරටත් ශ්‍රී ලාංකික පවුල්වල අරමුණු බලගන්වයි***

නෙස්ටොමෝල්ට් SALARY for LIFE 2022 වැඩසටහන තවත් ළබැදි පාරිභෝගිකයෙකුගේ අරමුණු බලගන්වමින් පසුගියදා නිමාවට පත්විය. මෙවර වැඩසටහනට ඉතා විශාල ඉල්ලුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත්ව තිබුණු අතර, පමුණුගම පදිංචි බී.කේ. ශ්‍රියාමිණී දිලිනි රොද්‍රිගෝ මහත්මිය මෙවර ජයග්‍රාහිකාව බවට පත්වූවාය. අඛණ්ඩව තුන්වැනි වසරටත් දියත් වූ මෙම සුවිශේෂී පාරිභෝගික ප්‍රවර්ධන වැඩසටහන මගින්, ඇයට වයස අවුරුදු 55 සම්පූර්ණ වනතුරු රු. 50,000 බැගින් (තරගයේ කොන්දේසි හා රෙගුලාසිවලට යටත්ව) මාසික දීමනාවක් හිමිවනු ඇත.

"දරුවන් තිදෙනෙකුගේ මවක් වශයෙන් මෙවර SALARY for LIFE ජයග්‍රහණය කිරීම මටත්, මගේ පවුලටත් ඉතා සුවිශේෂී අවස්ථාවක්. ගෙවුණු වසර කිහිපය තුළ අපි ගොඩක් අභියෝගවලට මුහුණ දුන්නා. එම නිසා මෙවැනි වටිනා වැඩසටහනක් සංවිධානය කිරීම ගැන නෙස්ලේ නෙස්ටොමෝල්ට් සන්නාමයට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. මෙම ත්‍යාග මුදල මගේ පවුලේ අරමුණු බලගැන්වීමටත්, ඔවුන්ට යහපත් අනාගතයක් උදාකරදීමටත් විශාල ශක්තියක් වන බව නොඅනුමානයි", යනුවෙන් ජයග්‍රහණය පිළිබඳ අදහස් දක්වමින් බී.කේ. ශ්‍රියාමිණී දිලිනි රොද්‍රිගෝ මහත්මිය පැවසුවාය.

මෙවර SALARY for LIFE වැඩසටහන ක්‍රියාත්මක වූයේ ඩිජිටල් ක්‍රමයට වීම විශේෂත්වයකි. තරගයට එක්වීම සඳහා පාරිභෝගිකයින් කළ යුතුව තිබුණේ, ඔවුන් මිලදී ගන්නා ග්‍රෑම් 400 නෙස්ලේ නෙස්ටොමෝල්ට් පැකට්ටුවල උඩු පියන්පතේ මුද්‍රිතව ඇති කේතය කෙටි පණිවුඩයක් (SMS) හරහා නෙස්ලේ වෙත එවීම පමණි. නෙස්ලේ ලංකා කිරි ආහාර අංශයේ අධ්‍යක්ෂ රුවන් වැලිකල මහතා, විකුණුම් අංශයේ අධ්‍යක්ෂ ජගත් වෙදගේ මහතා, නීති අංශයේ සහකාර අධ්‍යක්ෂ කීර්ති පතිරාජා මහතා සහ බස්නාහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ බදු නිලධාරිනී ශ්‍රියානි නාපාගොඩ මෙනවිය යන පිරිසගේ සහභාගීත්වයෙන් සිදුවූ ඩිජිටල් දිනුම් ඇදීමකදී අහඹු ලෙස ජයග්‍රාහකයා තෝරාගැනුණි.

"වසර 60කට අධික කාලයක් පුරා ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවලට බද්ධව සිටින නෙස්ලේ නෙස්ටොමෝල්ට්, තම පාරිභෝගිකයින්ට 100%ක සූදානමකින් සෑම දවසකටම මුහුණ දීමටත්, ධනාත්මකව ඉදිරියට යාමටත් නිබඳවම ශක්තියක් වී තිබෙනවා. මෙම අභියෝගකාරී කාලසමයේදී ළබැදි පාරිභෝගිකයින්ට අපගේ සහායත්, කෘතවේදීත්වයත් පළ කිරීමට අපට වුවමනා වුණා. ඒ අනුව, ශ්‍රී ලාංකික පවුල්වල අරමුණු බලගැන්වීමට නෙස්ලේ නෙස්ටමෝල්ට් සතු අභිලාෂය සැබවින්ම පිළිබිඹු කරන

වැඩසටහනක් ලෙස SALARY for LIFE තරගය හඳුන්වාදිය හැකියි", යනුවෙන් නෙස්ලේ ලංකා කිරි ආහාර අංශයේ අධ්‍යක්ෂ රුවන් වැලිකල මහතා ප්‍රකාශ කළේය.

නෙස්ලේ යනු වසර 115කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික ජීවිතවලට බද්ධ වූ සමාගමකි. මෙරට අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි නෙස්ලේ කර්මාන්තශාලාවේදී නිෂ්පාදනය කෙරේ. නෙස්ලේහි ප්‍රමුඛතම සන්නාමය වන නෙස්ලේ නෙස්ටොමෝල්ට් යනු වසර 60කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික පවුල්වල විශ්වාසය දිනූ නිෂ්පාදනයකි. ශ්‍රී ලංකාවේ පමණක් නිෂ්පාදනය කෙරෙන නෙස්ලේ නෙස්ටොමෝල්ට් ශ්‍රී ලංකාවේ ජනාදරය දිනාගත් ප්‍රමුඛතම මෝල්ට් ආහාරය වන අතර, මෝල්ට් බාර්ලි සහ කිරි යහගුණයෙන් ද, විටමින් සහ ඛනිජ ලවණ වලින් ද සරු කර ඇත.

---


**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |